# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 9,567—1946ක්වූ ජූනි මස 12 වෙනි දිනවූ බදාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### අභ්‍යන්තර වී මිලයට ගැනීමේ ක්‍රමය.

**වාරියපොල කොට්ඨාශයේ කොල මැඩවීම.**

ආරක්ෂා (මිශ්‍ර අණපනත්වල 37වෙනි වගන්තිය යටතේ 1943 ආරක්ෂා (වී ගොවිතැන පිළිබඳ) අණපනත් 1944 ආරක්ෂා (ආහාර සීමාකිරීමේ විශෙෂ බලතල) අණපනත් සහ 1942 ආරක්ෂා ආහාර ද්‍රව්‍ය මිලයට ගැනීමේ) සංශෝධනය කරණලද අණපනත් අනුව මෙසේ නියමකරමි :—

1. (අ) කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් වන්නි, දේවමැදි හත්පත්තුවල සියලු ගොඩ සහ මඩ කුඹුරු හිමියන් විසින් 1946 යල් කන්නේ කොල පෑගීමට පෙර ඒ ඒ කොට්ඨාශවල වෙල් මුලාදෑනියාට හෝ මා විසින් ලියවිල්ලකින් බලය දෙනලද නිලධාරියෙකුට දින 10කට ප්‍රථම දැන්විය යුතුයි.

(ආ) ඉහතකී පරිදි නිසිලෙස එකම ප්‍රධාන මුලාදෑනිතැනගේ කොට්ඨාශය ඇතුලත සිරිත්ප්‍රකාර තැන්පත්කර තබන තැනකට හෝ අටුවකට පහත සඳහන් කරුණු සම්පූර්ණකරගතුරු කමතේ සිට වී නොගෙන යා යුතුයි :—

(i.) මා විසින් ලියවිල්ලකින් බලයදෙනලද අයෙකු හෝ වෙල් මුලාදෑනියා විසින් අස්වැන්න ගණන්ගන්නාතුරුද,

(ii.) ඉහතකී මුලාදෑනීන් විසින් ලියවිල්ලකින් අවසරදුන් විටකද,

(iii.) ආණ්ඩුවට දියයුතු, අක්කරයකට වී බුසල් එක බැගින් පළමුවෙන් අයකරණු ලබන අක්කර බද්ද හැර වෙනත් මැනීපුර විද මා විසින් ලියවිල්ලකින් බලය දෙනලද ඉහතකී නිලධාරියෙකුට භාරදුන් පසුවද.

2. පළමුවෙනි විශේෂණයේ ප්‍රකාර 1946 යල් කන්නේ ගොයම් පාගා ඉහතකී අනුමට අවසරපත්‍ර පිට ගෙනගොස් තැන්පත්කරනුලැබූ වී, මා විසින් ලියවිල්ලකින් නියමකරණ විධියට හැර, මොනයම් අන්දමකින්වත් වී අලෙවිනොකළ යුතුයි. නමුත් ඉහතකී ආකෘවේ පරිදි මගෙන් අවසරයක් නොමැතිව පහත දැක්වෙන අන්දමට පාවිච්චිකළ හැක, එනම් :—

(i.) කොටස් අයිතිකරුවන් හා ඒ අයවලුන්ගෙන් නියම විශයෙන් යැපෙන්නන්ගේ හය මාසයක කෑම සඳහා, කුඹුරු හිමි කුඹුරු වැඩකරන්නන්ගේ හා නියම විශයෙන් කුඹුරු වැඩවල යෙදෙන්නන්ගේ පවුල්වල කෑම අවශ්‍යකට සතියකට කැපූම් මැනීමේ වී සේරු 6කට වැඩිනොවන ප්‍රමාණයක්ද, වයස අවුරුදු අටෙන් ඉහළ වෙනත් අයවලුන්ට සතියකට කැපූම් මැනීමෙන් වී සේරු 4 බැගින්ද කොයිම කොටස්කරුවෙකුට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට එක් කන්නට වී බුසල් 50කට වැඩිනොවන ප්‍රමාණයක් තබාගන්ට ඉඩදෙනු ලැබේ.

(ii.) ගොයම් කපාගත් කුඹුරුවලට වැපිරීම පිණිස බිත්තරවී විශයෙන් අක්කරයට වී බුසල් 3 බැගින් සහ ආහාර දීමට අක්කරයකට වී බුසල් එක බැගින් වෙන්කළ යුතුයි.

3. උකස් පිට භුක්තිවිඳින කුඹුරුවල අස්වැන්න මෙහි දෙවන විශේෂණයේ දක්වෙන අන්දමට හෝ වෙන කිසිම අන්දමකින්වත් ප්‍රයෝජනයට නොගෙන යා යුතුයි.

4. ඉහතකී පරිදි මාසයක් තුලදී නොපාගනලද ගොල සියල්ල මා විසින් අණ්ඩුවට ගනුලබන බව මෙයින් දන්වා සිටිමි.

5. (අ) එකම ප්‍රධාන මුලාදෑනිතැනගේ කොට්ඨාශයෙන් පිට වෙන ප්‍රධාන මුලාදෑනියෙකුගේ කොට්ඨාශයකට ඉහතකී වී ගෙනයාමට අදහස්කරණ යම් අයෙක් ඔහුගෙන් හෝ ඔහුවිසින් නියම බලය දෙනු ලැබූ නිලධාරියෙකුගෙන් අවසර ලබාගත යුතුයි. මේ කොට්ඨාශයෙන් පිට වී ගෙනයෑමට අදහස්කරන අය විසින් තමා පදිංචි දිසාවේ ඒජන්තතුමාගේ හෝ උප ඒජන්තතුමාගේ හෝ උප ආහාර පාලකතුමාගේ මාර්ගයෙන් ගොල කිටිවකලද දිනෙන් සිට සුමාන දෙකක් ඇතුලතදී D. F. C. 34 දරණ පෝර්මයක් පුරවා මා වෙත එවා ඒව බලපත්‍රයක් ලබාගත යුතුයි. එසේ නොකළහොත් ඒ සියළුම වී අණ්ඩුවට ගනු ලැබේ. මේ කොට්ඨාශයේ එක හත්පත්තුවක සිට තවත් හත්පත්තුවකට වී ගෙනයාමට D. F. C. 34 පෝර්මයක් පුරවාදී බලපත්‍රයක් ලබාගත යුතුයි.

(ආ) මේ කොට්ඨාශයේ උදිංචි ආදායම් පාලක කොටස් එකකට මැනිගණනකින් වී ලැබෙන අය විසින් වෙල් මුලාදෑනින් දෙනලද I. P. S. 4 හෝ 4*a* සහ I. P. S. 6 හෝ 6*a* දරණ පෝර්ම පුරවා අත්සන්කර එම මුලාදෑනීන්ට භාරදිය යුතුයි.

6. පහත සඳහන් පරිදි සහල් කූපන් භාරදිය යුතුයි:—

(අ) එක බුසලකට කූපන් 5 බැගින් ගොවියන් සහ කුඹුරු හිමි ගොවියන් විසින්ද.

(ආ) එක බුසලකට කූපන් 8 බැගින් ගොවිතැන් නොකරණ කුඹුරු හිමියන් විසින්ද (අඩිතර හෝ නිලව් කූපන් භාරනොදිය යුතුයි.) නියමිත පරිදි කෑම පිණිස වී වෙන්කළ විගාම පළාතේ ගම් මුලාදෑනියා වෙත නියි කූපන් භාරදිය යුතුයි.

7. ඉහතකී නියෝගය කඩකරණ අයවළුන්ට විරුද්ධව නීති මාර්ගයෙන් ක්‍රියාකරණ බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

ජී. පී. තම්බයියා,
හදිසි කටයුතු භාර උප ඒජන්තතැන,
වාරියපොල කොට්ඨාශය.

වම් 1946ක්වූ ජූනි මස 4වෙනි දින
කුරුණෑගල (ව.) කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.